ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය කොළඹ

# මාධ්‍ය නිවේදනය

Public Affairs Section

Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070

Email: chulickna@state.gov ● http://srilanka.usembassy.gov

Release No. 20160426

**රියර් අද්මිරාල් කිල්රන් ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ සංචාරය කරයි**

අප්‍රේල් 26, 2016: එක්සත් ජනපද විශේෂ මෙහෙයුම් විධාන ඒකකයේ, පැසිෆික් කලාපීය අණ දෙන නිලධාරී, රියර් අද්මිරාල් කොලින් ජේ. කිල්රන් තම සිව්-දින ශ්‍රී ලංකා සහ මාලදිවයින් සංචාරය, අප්‍රේල් 20 -23 දිනයන් හිදී නිමාකරන ලදී. මෙම සංචාරය තුලදී, මානුෂීය ආධාර ලබාදීමේදී, ස්වභාවික විපත් වලදී ප්‍රතිචාර දැක්වීමේදී සහ ආරක්ෂක සහයෝගිතා මෙහෙයුම් දියත් කිරීමේදී, මාලදිවයින් සහ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා මඟින් කළ හැකි අනාගත කාර්යභාරය පිළිබඳව රියර් අද්මිරාල් කිල්රන් සාකච්චා කරන ලදී.

"එක්සත් ජනපදය, ඉන්දියානු සාගරයේ වැදගත් නෞකා මාර්ග වල නිදහස සහ ආරක්ෂාව සුරැකීම උදෙසා සාගර ආරක්ෂාව තර කිරීමට කැපවී සිටී,"යැයි ශ්‍රී ලංකාවේ සහ මාලදිවයින් හි එක්සත් ජනපද තානාපති, අතුල් කෙෂප් පැවසීය.

මාලේ නගරයේ පිහිටා ඇති මාලදිවයින් ජාතික ආරක්ෂක බලකායේ 124 වැනි සංවත්සරය, රියර් අද්මිරාල් කිල්රන් එහි සංචාරය කරන දින යෙදී තිබුණි. බක් පුන් පොහෝ දින කොළඹට පැමිණි රියර් අද්මිරාල් කිල්රන්, ඉන් පසු දිනයේ ශ්‍රී ලංකා නාවික සහ ගුවන් හමුදා නිලධාරීන් සමඟ හමුවිණි .

###